11 ශ්‍රේණිය

සිංහල භාෂාව හා සාහිත්‍යය

දෙවන වාර පරීක්ෂණය - 2023

පිළිතුරු පත්‍රය - 1

| | | | |
|---|---|---|---|
| 1) 3 | 11) 4 | 21) 3 | 31) 3 |
| 2) 4 | 12) 1 | 22) 2 | 32) 4 |
| 3) 1 | 13) 3 | 23) 1 | 33) 1 |
| 4) 2 | 14) 4 | 24) 2 | 34) 2 |
| 5) 3 | 15) 4 | 25) 1 | 35) 3 |
| 6) 4 | 16) 3 | 26) 4 | 36) 4 |
| 7) 1 | 17) 2 | 27) 3 | 37) 4 |
| 8) 3 | 18) 1 | 28) 2 | 38) 3 |
| 9) 3 | 19) 4 | 29) 4 | 39) 2 |
| 10) 2 | 20) 3 | 30) 2 | 40) 3 |

**II පත්‍රය**

1)

i. (අ) ඌෂ්මාක්ෂර
(ආ) මූර්ධජ අක්ෂර

ii. ශීඝ්‍රගාමී කැල

iii. (අ) මහා + උපකාරී - ස්වරාදේශ සන්ධි
(ආ) දස + අත - පර ස්වර ලෝප සන්ධි

iv. අභිනන්දන ප්‍රතිරාව

v. බබළන............... සඳ

vi. (අ) මූලෝත්පාඨනය
(ආ) සෞභාග්‍යමත්

vii. (අ) වෛතාලෙන්
(ආ) කෙකිණිපත් ගැසීම

viii. නායකයන් විසින් රට වැසියෝ ආරක්ෂා කෙරෙති. / කරනු ලබත් / කරනු ලබති

ix. (අ) විභක්ති සමාස
(ආ) අන්‍යාර්ථ සමාස

x. (අ) සාහිත දෙසුම
(ආ) ව්‍යාකරණ ග්‍රන්ථ

2) රචනාව

මාතෘකාව හා සාරවත් බව ලකුණු - 08
අන්තර්ගතය - 12
ශිල්පීය දක්ෂතා - 05

3) සාරාංශකරණය

- සදාචාරාත්මක සමාජයක පුද්ගල සංවර්ධනයට උපදේශනය අත්‍යවශ්‍ය වේ.
- පෞරුෂ සංවර්ධනයේ දී උපදේශනය වැදගත් ය.
- ආගම , සාහිත්‍ය පුද්ගල සදාචාරයට මෙහෙවරක් ඉටු කර ඇත.
- ග්‍රීක , භාරතීය , චීන ශිෂ්ටාචාරයන්හි සංස්කෘතීන්වල පවා උපදේශන සාහිත්‍යයට විශේෂ ස්ථානයක් හිමි වේ.
- සාහිත්‍යාංගයක් උපදේශනයෙන් අවසන් වීම සහෘද ජීවිතයට වැදගත් වේ.
- සීගිරි ගී අනුරපුර යුගයේ අපට හමු වූ විශේෂ උපදේශන සාහිත්‍යාංගයකි.

4)

i. අපූර්ව වස්තුවක්
ii. නිර්මාපකයා
iii. ප්‍රතිභානය / ප්‍රතිභා ශක්තිය / අපූර්ව වස්තු නිර්මාණය කිරීමේ හැකියාව
iv. සංවේදීතාව ඇති තැනැත්තා / රස විඳීමේ ශක්තිය ඇති කෙනා
v. රසය නැමති වේදිතය පසක් කර ගැනීම

5) ලකුණු ප්‍රදානය

| | |
|---|---|
| ආකෘතිය | - 04 |
| අන්තර්ගතය | - 08 |
| ශිල්පීය දක්ෂතා | - 05 |

නැතහොත්

| | |
|---|---|
| ආකෘතිය | - 04 |
| අන්තර්ගතය | - 08 |
| ශිල්පීය දක්ෂතා | - 03 |

## සිංහල භාෂාව හා සාහිත්‍ය III

1)

i. (අ) කාව්‍යශේඛරය , ගුත්තිල කාව්‍ය , සඳ කිඳුරු දා කව , කුස ජාතක කාව්‍යය , දහම් සොඬ දා කව
(ආ) වර්තමාන කතාව
අතීත කතාව
සමෝධානය
ii. (අ) තමා අකෘතඥයෙකු නොවන බව ගුරුතුමාට ඇඟවීම සඳහා
(ආ) 511 කි
iii. (අ) පී.බී. අල්විස් පෙරේරා , කපිල සෙනෙවිරත්න , මාකඳුරේ ගුණවර්ධන
(ආ) සුවඳ
iv. (අ) සුත්ත නිපාත අට්ඨකතාව වන පරමත්ථ ජෝතිකාව
(ආ) උක්දණ්ඩේ පැණි සේමා
යක් දෙඹරේ වද සේමා
v. (අ) අසරණ ගැමියන්ගේ දුඃඛිත බව හා කුටෝපක්‍රම වලට හසුවී ඔවුන්ගේ ජීවිත විනාශ වන ආකාරය
(ආ) වානරයා ,වන සරණ , මැකී ගිය දඩමං
vi. (අ) පිං ඇති සරසවි වරමක් දෙන්නේ
(ආ) ශක්තිමත්
ශක්‍රයා
vii. (අ) බුදුන් වහන්සේ හඹාදිව ගිය අංගුලිමාල ඉතා වෙහෙසට පත්ව බුදුන් වහන්සේට නවතින්න යැයි කියූ අවස්ථාවේ බුදු රදුන් හා අංගුලිමාල අතර ඇති වන සංවාදයේ දී බුදුන් වහන්සේ පිළිබඳව අංගුලිමාලගේ සිත තුළ ඇති වන සිතුවිල්ල
(ආ) අමාවතුර
viii. (අ) උග්ගසේන සිටු පුත්‍රයා විසින් විද්දත් දියණියට / තමාගේ ස්වාමි දියණියට
(ආ) බුද්ධ ඝෝෂ හිමි
ix. (අ) වීදාගම මෛත්‍රී හිමියන් විසින්
(ආ) බුදුගුණ අලංකාරය, ලෝවැඩ සඟරාව, දහම්ගැට මාලාව, එළු අත්තනගලු වංශය,
කව් ලකුණු මිණි මල
x. (අ) පුනරුප්පත්තිය හා තවත් කෙටි කතා
xi. (ආ) නොනිමි සිත්තම හා තවත් කෙටි කතා

2)

i. (අ) සේනකාදී පණ්ඩිතවරු සතර දෙනා
(ආ) සී මැදුර කවුළුව හැර පිටත බලා බ්‍රහ්මදත්ත රජු ආ බව දැන බියට පත්ව තමන්ගේ ජීවිතය අහිමි වේදැයි බියෙන් සේනකාදීන් සමඟ කතා කර කර සිටියේ ය.

ii. (අ) දිගන්තය පුරා පැතිර යන වීණා නාදය විශේෂයෙන් අසමින් ගස උඩ ඉන්න ගිරවුන් ඉතා ආශාවෙන් ගත් මධුර රසැති අඹ පවා ඉවත දැමූහ . මන්ද යත් මී අඹ රසයට වඩා රසයක් වීණා නාදයෙහි පැවති බැවිනි.

(ආ) විශේෂයෙන් ඉතා ආශාවෙන් , උන් මුඛයෙන්

iii. (අ) '' නිදහස මහා මුහුදක් වේ
එහි උල්පත පුත නුඹ වේ''

(ආ) රටක නිදහස මහා සාගරය තරම් සුවිසල් ය. එය මිනිය නොහැකි ය. එය එම නිදහස ලබාගැනීමේ දී මූලික විය යුත්තේ පුතේ නුඹ යි. ඒ බව සිතෙහි තබා ගනිමින් ලොවට යුතුකම් ඉටු කළ යුතු වේ.

iv. (අ) සොරා ද ඒ වන විට නපුරු කටුක ආහාරයෙන් ද දුක් සහගත නිදීම ද නිසා කලකිරීමට පත්විය. ඇඟිලි දහස සපිරෙන්න තව අවශ්‍ය වූයේ එක් ඇඟිල්ලකි. එනම් එකකු මරා ගැනීමෙන් ඇඟිලි දහස සම්පූර්ණ වෙයි යන සිතින් යුතුව ඊළඟට පළමුව දකින්නේ කවුද ඒ කවුරු හෝ වේවා ඒ තැනැත්තා මරා ගණන සම්පූර්ණ කරමි.

(ආ) දුක් සහගත නිදීම ද
කලකිරීමට පත්ව

v. අතිශයින් මටසිලුටු වූ නළල කස්තුරි තිලකයෙන් සරසා ගෙන , පිපුණු මානෙල් මල් මාලා හිසෙහි දවටාගෙන කෙළි කවටකම් කරමින් විනෝදකාමී තරුණයන් එහෙමෙහෙ ගමන් කරති.

(අ) පිපුණු

(ආ) විනෝදකාමී තරුණයන්

3)

i. උපමා අලංකාරවලින් යුතු භාෂාවක් යොදා ගැනීම -

- ❖ සාල්ලෙක ලාලා පාතට බාන කෙනෙකුන් මෙන්,
- ❖ මඳ පවනට බඳු වූ වේගයෙන් පියාසර කොට
- ❖ මඟුල් උයන නඳුන් උයනක් සේ සරසා
- ❖ සිංහ නාද ඇසූ මුව පොල්ලන් පරිද්දෙන්
- ❖ සිංහයෙකු විසින් රක්නා ලද රන් ගල් ගුහාවක් පරිද්දෙන්
- ❖ දණ්ඩකින් පහරන ලද සර්ප රාජයෙකු සේ
- ❖ වේරම්භ වාතයෙන් හැළලී ගිය මහා සාගරය සේ
- ❖ දණ්ඩෙන් ගසන ලද ආශිර්විෂයක්හු මෙන්
- ❖ කොක් කරක් සේ දික් වු කර ඇති
- ❖ ඔද වැඩියා වූ සාගරය පරිද්දෙන්
- ❖ අසුර යුද්ධයට නික්මුණු සක්දෙව් රජහු පරිද්දෙන්
- ❖ රත්වද මලක් සේ ලේ හා පස් හා වකා
- ❖ පොළොව මැඩ පියන්නා සේ
- ❖ රජ්පුරුවන්ගේ ඉස තල්පැන් පලක් මඬනා සේ

අදාළ පුවත් හා සම්බන්ධ කර ලියා තිබිය යුතු ය.

ii. අවස්ථා නිරූපණ -

- ❖ කේවට්ට විඳින සැප සම්පත් පිළිබඳ කෙරෙන නිරූපණය
- ❖ සුවඳ තෙලෙහි නගන ලද පහන් ආලෝකයෙන් ගන්ධදාම පුෂ්පදාමාවලම්බිත නනා වර්ණ විචිත්‍ර විතානෝපලක්ෂිත අලංකෘත වූ ශ්‍රී යහන් ගර්භය බලන්නා හු මහත් වූ සම්පත් දැක
- ❖ ''දේවයන් වහන්ස නුඹ වහන්සේගේ කන මැතට නමා ලුව මැනව ..... '' ''කියා ආචාරීනි , තොප කිවාක් කෙරෙමි......''
- ❖ '' මඟුල් උයන නඳුන් උයනක් සේ සරසා දහස් ගණන් කුඩම්වල රා පුරාතබ්බා අනේක ප්‍රකාර මසවුළු ඒ ඒ ස්ථානයන් වළන් පුරා රැස් කොට තබව '' යි......
- ❖ ''අපගේ රජ්පුරුවන්ට අස්න පමණකුත් නොලබන්නා මෙන් දැන් තොප රාත් පිය නො දෙම්හ යි......''
- ❖ '' ඒ මහෞෂධයන් කුමක් කෙරේද? '' .... යි කියා , එසේ ම අභිමාන පුරස්සර වූ එක් සියයක් රජ දරුවන් පිරිවරා වේරම්භ වාතයෙන් හැළලී ගිය මහා සාගරය සේ ......

**තලතා දේවිය ප්‍රශ්න විසඳන ආකාරය -**

- '' දරුව තොප අත තිබූ සාල් නැළියක් බත් මුළක් මසු දහසක් පිළිවෙළින් බිම තබා ලා .....''

**මියුලු නුවර වටලෑම -**

- අතිත් මුහුණින් උසුළු පෑ
- නොයෙක් ප්‍රකාරයෙන් ආක්‍රෝෂ පරිභව බෙනෙමින් ගහට කරන්නා හ.....''
- ''පණ්ඩිතයෙනි තොපට සුදුසු පඩුරක් සොයන්නෙම් අද මේ මිණි රුවන ලදිමි. හැර ගනුව ..... අත ඇඟිලි අග මැණික එළලු සේක.

**කේවට්ටගේ මුහුණ බිම අතුල්ලන අවස්ථාව -**

- ........ ඔසවා ගත නොදීම එක් අතෙකින් පිටිකර හා එක් අතෙකින් පිටි මුල හා තරයේ අල්ලාගෙන , '' නැගි සිටුව ! ආචාරිනි, නැගි සිටුව ආචාරිනි , මම බාලයෙමි. තොපගේ මුණුබුරු තරමට ඇත්තෙමි.

**නැතහොත්**

**ඉපැරණි ගමක තොරතුරු**

සාරපලය අඹ දඹ රඹ ද වල් පිට
මීර ජලය ඇළ දොළ කඳු පිටින් බට
නෑර ලොලය වඩවන දුටු දනන් හට
කැරගලය වැජැඹෙයි මේ ලෙසින් සිට

ඇසෙයි නිබඳ සුවදැල් කෙත්වත් අවට
ඇසෙයි ළමා වසුපැටියන් හඬ දුරට
දිසෙයි වෙහෙර එහි සුරවිමනක් ලෙසට
රසෙයි අමා රසමය ඒ පියස දුට

අර්ථ රසය , ශබ්ද රසය

මිහ'ඹ මුව මඬල මෙන් දිලෙන හැම විට
දුලබ ඉසුරු පිරි සැදි ඒ වෙහෙර පිට
කිරඹ පොකුරු මී රස ලැබ බොන ලෙසට
නරඹ මිතුර තගෙ නෙත සිත සතුටු කොට

නුදුරුව සිහිලැලීය ගගු ලැ ලීය
වට සැදි මල් වැලීය සුදු වැලීය
පිපි වන සිටි මලීය වන මලීය
තුටුවන සිතිවිලීය පුල් විලීය

4)

i. කතුවරයා යොදාගත් භාෂාව - ගැමි භාෂාව
'' දැන් නම් හරි ඩාදිය අක්කේ , හවසට අඹරමු....
'' එහෙනම් කුලී කාරයෙක් හොගනින් මට බෑ කිව්වොත් බෑ''
''කවුද මේ ගෙදර තාත්තා''
''මේ ගෙදර කක්කුස්සියක් තියෙනවාද?''
''යාප්පු වන්නට පටන් ගනී''

ii. තාත්තා කොහෙන් පහළ වුණා ද කියලා මටත් පුදුමයි
- පිච්චෙයි පිච්චෙයි කලබල නැතිව ඉඳින් ටිකක්

තවත් අදාළ නිදසුන් පිළිතුරු ලෙස භාර ගත හැකිය.

උපමා අලංකාරවලින් යුතු භාෂාවක් යොදා ගනී

- ''තෝ හොර අලියා වගේ මෙතන කකා ඉන්නවා''
- ''කම්මලේ සිටින බල්ලාට යකඩ තලන හඬ මෙන් ඇයට ද මේවා ගණනක් නැත''
- යුගල පද -
    - සැරපරුෂ බවක් නොපෙනෙයි
    - යළිත් උඩබිම බලන්නට විය
    - කැම්බීම් සේරම දෙපා මුලට පහළ වෙයි
- කට වහර -
    - කුණු ඉස්පැට්ටර
    - ගෙදෙට්ට ගිහින් ඇහැව්වලු
- හාස්‍ය රසය
    - සෞඛ්‍ය පරීක්ෂණයට පිළිතුරු දෙන ආකාරය
    - කක්කුස්සියක් තියෙනවාද?
    - මෙහෙ මොන කක්කුස්සිද? යන්න ඔතනින් ඔය බැද්දට පාත් වෙන්න. කෙල්ලෙ මේ මහත්තයට වතුර පනිට්ටුවක් ගෙනත් දීපන්''
    - කොළඹ රටේ කක්කුස්සි ගේ ඇතුළෙම ලු. ෂික් විතරක්.
- සංවාදශීලි නාට්‍ය රූපි භාෂාව -
    - ''කෝ කවුද හේරත් කියන්නේ''
    - ''මම''
    - ''කෝ වැසිකිළිය හැදුවාද?''
    - ''තවම ඉවර නෑ''
- කුතුහලයෙන් යුතු වීම -
  අදාළ නිදසුන් පිළිතුරු ලෙස භාරගත හැකිය

iii. චරිත නිරූපණය - විශ්වාසනීය බව
ළමා චරිත ස්වභාවය - මල්ලී
''මේ උදේ ම කුරහන් අඹරන්න පුළුවනැ. දවල් වෙලා එන්නම්.....''
''තාත්තා එනවා දැකලා මට බත්තවන්ඩ හැදුව නේද?.....''
අක්කා - වගකීම් දැරීම
''ඇයි මල්ලී එහෙම කියන්නේ. අසනීපයෙන් ඉන්න අම්මට පුළුවන්ද ඕවා කරන්න.''
තාත්තාගේ චරිතය - නිවසේ දී ආධිපත්‍ය පැතිරවීම.
'' ඔව් හැමදේ ම බැහ් බැහ් කට විතරයි හොල්ලන්න පුළුවන්.''
තාත්තා - සෞඛ්‍ය පරීක්ෂක ඉදිරියේ
නූගත් බව - ගැමිබව
''කවුද මේ ගෙදර ගෘහ මූලිකයා යන්න තේරුම් ගැනීමට නොහැකි වීම''
''කවුද මේ ගෙදර ලොක්කා''
''මම'' බියාදු ලෙස පිළිතුරු දීම
අදෘෂ්‍යමාන බලවේග ගැන විශ්වාසය -
''අම්මා ඇහැට නොපෙනුනාට සමහර පෙරේතයෝ ඉන්නවා කඳු පර්වත තරම් විශාල.....''
නංගී - නව සංස්කෘතියට ඉක්මනින් ම හැඩ ගැසීම
''ආහ් ... එයාට විතරක් මොකද? මමත් හෙට යනවා''

තවත් අදාළ නිදසුන් ගළපා ලියා ඇත්නම් පිළිතුරු ලෙස භාරගත හැකිය.

නැතහොත්

රූපකාර්ථ යෙදුම් භාවිතය -

<u>නිදහස මහ මුහුදක්</u> වේ
<u>එහි උල්පත</u> පුත නුඹ වේ
ඒ බව සිහි කොට මෙලො වේ
යුතුකම ඉටු කළ යුතු වේ

<u>ජාතිය රන් විමනක්</u> වේ
<u>ආගම මිණි පහනක්</u> වේ

එය රැකගන්නට මෙලො වේ
සමත් වෙතොත් පුත නුඹ වේ

සරල භාෂාවක් යොදා ගැනීම - රසවත් බව , හරවත් බව

කරදර දහසක් හමු වී
ඉන්ටැකි නම් සිනා වෙවී
ඔහු මෙලෙවට පහළ දෙවී
රජෙකැයි සලකනු මැනවී

ඉටු කොට කළ යුතු යුතුකම්
ලැබුණොත් ලෝකෙන් ගැරහුම්
ඉවසන්නට පුළුවන් නම්
උඹයි මගේ පුතා උතුම්

තවත් අදාළ නිදසුන් පිළිතුරු ලෙස භාරගත හැකිය.

5) ජන කවියේ ඇති අව්‍යාජත්වය
ගොවි ජන ජීවිතයේ ඇති දුක්බර ස්වභාවය
දුරුතු මහේ දී කැළයට වැදීලා
මසක් පමණ කල් කැලවල් කොටාලා
මැදින් දිනේ දී වල් ගිනි තබාලා
කුරහන් ඉසිමුව කළුවර බලාලා

හේනේ පැළේ මා විදිනා සුරුක්කන්
ඌරෝ ඇවිත් වට පිට කරති සක්මන්
වැටටත් උඩින් උන් අල්ලන මළක්කන්
අපොයි මගේ කිරි විදිනා කුරක්කන්

කටු අල්ලේ මහ හේනේ කුරක්කන්
වැට අහුරා ඌරන්ගෙන් වළක්කන්
කරගන්නට බැරි උන් මහ කුරක්කන්
ඌරනි නොකා පලයව් මගෙ කුරක්කන්

අදාළ නිදසුන් පිළිතුරු ලෙස භාරගත හැක.

6) **හාස්‍යය , උපහාසය හා අනුකම්පාව**

උග්ගසේන සිටු පුත්‍රයා විද්දත් දියණිය කෙරෙහි දැඩි ප්‍රේමයෙන් වෙලී කතා කරන ආකාරය -
'' ලදොත් ජීවත් වෙමි නොලදොත් මියෙමි , සිතා ගෙන නොකා නොබී හැඳට නැගීලා වැද හොත්තාහ.''
විද්දත් දියණිය සිටු පුත්‍රයට දාව උපන් පුතු නළවන ආකාරයෙන් -
'' ගැල් රකිනවුගේ පුත ' '' බර උසුලන්න වූගේ පුත, '' '' කුමකුත් නොදන්න වුගේ පුතැ'' යි කිය කියා නළවයි.''
විද්දත් දියණිය හැරදමා යන්නට සුදානම් වන්නේ ඇගේ අනුකම්පාව ලැබේ යයි සිතා ය. එහෙත් ඇය ඔහුට දෙන පිළිතුර -
'' තොප ගිය මැන , හුන මැනව , තොප කුමකුත් නොදන්නා තැනැත්තවුන්ගෙන් මට කම් කිම්ද?

අදාළ වෙනත් උදාහරණ ද පිළිතුරු ලෙස භාරගත හැක.

7)

- පුංචි රාළගේ චරිතය - ඔහුගේ හිත ළතෙත් බවෙන් තොරය. ඔහු කටයුතු කරනුයේ පීඩාවට පත් පුංචි මැණිකාගේ සිත තව තවත් දවාලන ලෙස ය. තම සැමියා වන බබුන් පිළිබඳ විමසූ විට ඔහු පවසනුයේ,
  '' මිනිහා අනුමානයක් නෑ මැරෙන්ඩ ඇති'යි '' යනුවෙනි.
  '' ඔව් මං හිතනවා මිනිහා මැරිලා යි කියලා හිර ගෙදරට යන මිනිස්සු උන් හැටියේ මැරෙනවා......
  කරුමෙට බේත් තියෙනවායැ'
  '' උඹ ගමේ මේ ගමේ ඉන්න කවුරු හරි කසාද බැඳගනින් .....''
- පුංචිරාළ වෙදරාළගේ සිත තුළ පුංචි මැණිකා පිළිබඳ සිතුවිල්ල -
  ''ඉලන්දාරියෙක් නැත්නම් නාකියෙක් වුණත් මොකක්ද ඇති වැරැද්ද?.....''
  තම සැමියා මළා ද යන්න ගැන නිශ්චිත තොරතුරක් ඇසූ විට -
  ''මං අහපු ආරංචියක් නැහැ. කාගෙන් ද ආරංචි අසන්නේ..... උඹට ආරංචියක් දැන ගන්ඩ ඕනෑ නම් ඒකට යන්ඩ ඕනෑ හිර ගෙදරට.....''
- සිරගෙදර අසල සිටි මහල්ලාගෙන් සිරගෙදර පිළිබඳ හා තම සැමියා පිළිබඳ තොරතුරු විමසූ විට ඔහු පිළිතුරු දෙන්නේ පුංචි මැණිකා පිළිබඳ සානුකම්පිත හැඟිමෙනි.
  '' උඹේ ගම කොහෙද ළමයෝ.....''
  ''බැද්දේගම, ඔව් මං දන්නවා බොහොම ඉස්සර හිට දන්නවා ඒ ගම ගැන මාත් ඒ පැත්තේ තමයි....''
- පුංචි මැණිකා ගැන මහල්ලාගේ සංවේදී බව ප්‍රකාශවන ආකාරය -
  ''මහල්ලා ඉතා සෙමින් හිස හරවා මහ හිර ගෙය දෙස නෙත් යොමු කළේ ය. හිරු රැස් මහල්ලාගේ මුහුණට කෙළින් වැටිණි.....''
  ඔහු පුංචි මැණිකාට පිළිතුරු දෙන්නේ කම්පිත බවින් යුතුව යි.
  ''කවදාවත් මිනිහෙක් මෙතනින් එළියට එන්නේ නෑ.... කොහොම ද මිනිහෙක් ඕක ඇතුළෙ ජීවත් වෙන්නේ......

තවත් අදාළ නිදසුන් ඇත්නම් පිළිතුරු ලෙස භාරගත හැකි ය.